# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No – 10120

ෆැක්ස් / தொலைநகல / Fax – 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone – 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site – www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail – dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO – 338/2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No – / 2024

දිනය / திகதி / Date – 25/02/2024

පැය1045

## මාධ්‍ය නිවේදනය

**පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු**

**01. 2024.02.24 වන දින පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරින් විසින් සිදු කරන ලද නීති විරෝධී මත්පැන් වැටලීම් සම්බන්ධ වාර්තාව පහත පරිදි වේ.**

| වැටලීම් ගණන | අත්අඩංගුවට ගත් සැකකරුවන් ගණන | නීති විරෝධී මත්පැන් ප්‍රමාණය (ලීටර්) | ගෝඩා ප්‍රමාණය (ලීටර්) | වෙනත් දේපල |
|---|---|---|---|---|
| 04 | 04 | 97.250 | - | - |

වැටලීම් සිදු කර අත්අඩංගුවට ගන්නා ලද සැකකරුවන් හා දේපල අදාළ පොලිස් ස්ථාන වෙත ඉදිරිපත් කර ඇත.

**02. මනුෂ්‍ය ඝාතනයකට ආධාර අනුබල දුන් සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා සංවිධානාත්මක අපරාධ මර්ධන ඒකකය.**

2024.02.24 වන දින අලුයම් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා සංවිධානාත්මක අපරාධ මර්ධන ඒකකයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත හක්මන පොලිස් වසමේ උඩහවත්ත, නරවැල්පිට දකුණ ප්‍රදේශයේ දී වැටලීමක් සිදු කර 2024.02.21 වන දින මහබාගේ පොලිස් වසමේදී වෙඩි තබා පුද්ගලයකු ඝාතනය කිරීමේ සිද්ධියට ආධාර අනුබල දුන් සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන වැඩිදුර විමර්ෂන කටයුතු සඳහා මහබාගේ පොලිස් ස්ථානය වෙත භාර දී ඇත. **අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 32 ක් වූ උඩහවත්ත නරවැල්පිට ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.** මහබාගේ පොලිස් ස්ථානය වැඩිදුර විමර්ෂන පවත්වාගෙන යනු ලබයි.

**03.** **මත් ද්‍රව්‍ය සමඟ සැකකරුවන් පස් දෙනෙකු සහ කාන්තාවක් අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා බුද්ධි කොට්ඨාසය**

2024.02.24 වන දින උදෑසන කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා බුද්ධි කොට්ඨාසය, පොලිස් විශේෂ කාර්ය බලකා මූලස්ථානය, ජයවර්ධනපුර කඳවුර හා සංවිධානාත්මක අපරාධ මර්ධන ඒකකයේ නිලධාරීන් හා ඒකාබද්ධව වැල්ලම්පිටිවය පොලිස් වසමේ සංහිඳ සෙවණ මහල් නිවාස සංකීර්ණයේ විශේෂ සෝදිසි මෙහෙයුමක් සිදු කර හෙරොයින් ග්‍රෑම් 12 මිලි ග්‍රෑම් 230ක් ඇතුළු මත්ද්‍රව්‍ය සන්තකයේ තබා ගෙන සිටි සැකකාරියක් හා සැකකරුවන් පස්දෙනෙකු අතුඅඩංගුවට ගෙන වැඩිදුර විමර්ෂණ සඳහා වැල්ලම්පිටිය පොලිස් ස්ථනය වෙත භාරදී ඇත.

**අත්අඩංගුවට ගත් කාන්තාව වයස අවුරුදු 31 හා සැකකරුවන් වයස අවුරුදු 24ත් 43ත් අතර වයස් වල පසුවන සංහිඳ සෙවණ මහල් නිවාසයේ පදිංචිකරුවන් වේ.** වැල්ලම්පිටිය පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**04.** **බලපත්‍ර කොන්දේසි උල්ලංඝණය කරමින් පතල් කැණීම් කටයුතු සිදු කරමින් සිටි සැකකරුවන් හය දෙනෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා කහවත්ත කඳවුර.**

2024.02.24 වන දින දහවල් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා කහවත්ත කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත පැල්මඩුල්ල පොලිස් වසමේ මොරතොට හා මෝල්දෙණිය ප්‍රදේශ වලදී වැටලීමක් සිදු කර බලපත්‍ර නොමැතිව හා බලපත්‍ර කොන්දේසි උල්ලංඝණය කරමින් ස්කැවේටර් යන්ත්‍ර යොදා ගනිමින් පතල් කැණීම් කටයුතු සිදු කරමින් සිටි සැකකරුවන් හය දෙනෙකු එම ස්කැවේටර් යන්ත්‍ර 03ක් හා ගැරුම් යන්ත්‍ර 01ක් සමඟ අත්අඩංගුවට ගෙන වැඩිදුර විමර්ෂණ කටයුතු සඳහා ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය ඇහැළියගොඩ ඒකකය වෙත භාරදී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 25ත් 64 ත් අතර වයස් වල පසුවන පැල්මඩුල්ල, කහවත්ත, කුරුවිට හා ඇඹිලිපිටිය යන** ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.
**වැඩිදුර විමර්ෂන කටයුතු ජාතික මැණික් හා ස්වර්ණාභරන අධිකරීය විසින් සිදු කරනු ලබයි.**

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**